2024.03.13

සාමාන්‍ය පෙළ පොදු සහතික පත්‍ර වර්ෂ අවසාන වාර විභාගය
2024 - පෙබරවාරි
**දේශීය නර්තනය**

කාලය පැය 01

Learning Passport R De Mazenod College Kandana

## I කොටස

**ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න**

**අංක 01 සිට 10 තෙක් ප්‍රශ්ණවල හිස්තැන් වලට සුදුසු වචනය තෝරන්න**

01. පා සරඹ අභ්‍යාස කිරීමේදී යොදා ගන්නා සහ වාද්‍ය භාණ්ඩය ............................ නම් වේ
    i. ගැට බෙරය ii. අත් මිණිය
    iii. තාලම්පොට iv. පන්තේරුව

02. අහුර අල්ලමින් අග මුල කපාගෙන මෙම කවි පදය අයත් වන්නේ ............................ ගායනය
    i. ගොයම් කවි ii. මෝල් ගස් කවි
    iii. ලී කෙලි iv. පන් නෙලීමේ කවි

03. ලය ප්‍රභේද අනුව නර්තනයේදී ඉතා අඩු වේගය ............................ ලෙස හැඳින්වේ
    i. විලම්භ ii. මධ්‍ය
    iii. අභිද්‍රැත iv. ද්‍රැත

04. ............................ ගම්පොල යුගයේ රචිත සන්දේශ කාව්‍යයක් වේ.
    i. තිසර ii. පරවි
    iii. කොවුල් iv. හංස

05. අදහස් ප්‍රකාශ කිරීමේදී ආංගික, වාචික, සාත්වික, ආහාර්ය යනුවෙන් හැඳින්වෙන්නේ ................ යි
    i. තාලය ii. ලය
    iii. අභිනය iv. ගායනය

06. සිංහල නර්තන කලාව නම් කෘතිය රචනා කරන ලද්දේ
    i. ජයසේන කෝට්ටෙගොඩ ii. මුදියන්සේ දිසානායක
    iii. එදිරිවීර සරත්චන්ද්‍ර iv. ශ්‍රියානි රාජපක්ෂ

07. මුරුගන් දෙවියන්ට පූජෝපහාර පිණිස නටනු ලබන ද්‍රවිඩ ගැමි නැටුම් විශේෂය වන්නේ ..........ය
    i. වෙම්බු ii. කෝලට්ටම්
    iii. සුලංකු iv. කාවඩි

08. පොළොන්නරු යුගයට අයත් සෙල්ලිපියක් වශයෙන් ............................ දැක්විය හැක
    i. සැස්සෝරුව සෙල් ලිපිය ii. කොරවක්ගල සෙල්ලිපිය
    iii. පාහියන්ගල සෙල්ලිපිය iv. පාලමොට්ටෙයි සෙල්ලිපිය

09. ශාන්තිකර්මයක් සැලසුම් කිරීමේදී ප්‍රථමයෙන්ම ............................ චාරිත්‍රය සිදු කරනු ලබයි.
    i. මඩු පේ කිරීම ii. කොට පේ කිරීම
    iii. කප් සිටුවීම iv. මල පේ කිරීමේ චාරිත්‍රය

10. සමාජීය උත්සවයන් වලදී වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩයක් ලෙස ............................ දැක්විය හැක.
    i. බංකු රබාන ii. ගැටබෙරය
    iii. පන්තේරුව iv. යක් බෙරය

**11 සිට 40 දක්වා ප්‍රශ්ණ වල නිවැරිදි පිළිතුර යටින් ඉරක් අඳින්න**

11. බෙර ඇස සැකසීමේදී හරක් බොක්කක් යොදාගෙන ඇත්තේ
    i. ගැට බෙරය ii. දෙවොල් බෙරය
    iii. දවුල iv. රබාන

12. විහාරවල සේවාවන් සඳහා නියම වූ කුලවලින් පැමිණි කලගෙඩි සෙල්ලමේ යෙදෙන නළඟනෝ වෙති.මෙම සටහන කරන ලද්දේ

i. ඉබන් බතුතා   ii. පාහියන් භික්ෂුව

iii. රොබට් නොක්ස්   iv. ස්පිල් බර්ජන්

13 ශෝක නම් ස්ථායී භාවයෙන් උපදින රසය වන්නේ

i. ශාංගාර රසය   ii. කරුණා රසය

iii. වීර රසය   iv. හාස්‍ය රසය

14. දැනට ලී ගෙන කණුවක් වටේ රවා මවමින් නටන දේශීය ගැමි නැටුම ............... වේ

i. කෝලාට්ටම්   ii. කාවඩි

iii. ලී කෙලි   iv. ලී මල්ලිය

15. කොහොඹා කංකාරියට සහභාගී වන ප්‍රධාන ඇදුරා හඳුන්වන්නේ

i. ආතුරයා නමින්   ii. අතෝරකරු නමින්

iii. යක් දෙස්සා නමින්   iv. යකැදුරා නමින්

16. පහන් මඩු ශාන්තිකර්මයේ කතා පුවත හා බැඳි රජු වන්නේ

i. පඬුවස්දෙව් රජු   ii. මහා සම්මත රජු

iii. සේරමාන් රජු   iv. සංඛපාල රජු

17 ආසාතාත්මක හා අනාසාතාත්මක යන ලක්ෂණ දෙකම එකවර යෙදෙන ගායනා විශේෂයක් වන්නේ

i. හටන් කවි   ii. වීකා කවි

iii. පාරු කවි   iv. ප්‍රශස්ති

18. උඩරට වන්නම් රචිත යුගයක් වශයෙන් සැලකෙන්නේ

i. කෝට්ටේ යුගය   ii. මහනුවර යුගය

iii. දඹදෙණි යුගය   iv. පොළොන්නරු යුගය

19. 

දක්වා ඇති නර්තනාංග රූප පිලිවෙලින් වන්නේ

i. තෙල්මේ හා අඩව්දමන

ii. තෙල්මේ හා වඩිග පටුන

iii. වඩිග පටුන හා තෙල්මේ

iv. වඩිග පටුන හා දෙවොල්

20. පිළිවෙලින් ඉලංගම් සරඹ හා ගොඩ සරඹ අවසානයේ නටනුයේ

i. කස්තිරම සහ සීරුමාරුවයි   ii. ඉරට්ටිය සහ අඩව්වයි

iii. කස්තිරම සහ ඉරට්ටියයි   iv. ඉරට්ටිය සහ කස්තිරමයි

**21 සිට 25 දක්වා වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| පේළිය | 1 තීරුව | 2 තීරුව | 3 තීරුව | 4 තීරුව |
|---|---|---|---|---|
| A | පුංග් | පුංග් චෝලම් | ජිම්ක්කි | පත්තුකාරායන් |
| B | වෙන්ඩාව | රාස්ලීලා | දාපට්ටා | ආසන් |
| C | මෘදංගය | වර්ණම් | මකුට පළඳනාව | ශිංගිඩි |
| D | ඉලකාලම් | තේඩායම | නෙත්‍ර පිට්ටම් | නට්ටුවාංකාර් |

21. මනිපුරි නර්තනයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය හා එම භාණ්ඩය යොදාගනිමින් කරනු ලබන නර්තනය වන්නේ

i. B 1 හා B 2 තීරුව   ii. A 1 හා A 2 තීරුව

iii. C 1 හා B 1 තීරුව   iv. D 1 හා A 2 තීරුව

22. භාරත නර්තන සම්ප්‍රදායට අයත් නර්තනාංගයක් වන්නේ
i. C පේලියේ 2 තීරුවයි
ii. B පේලියේ 3 තීරුවයි
iii. A පේලියේ 4 තීරුවයි
iv. C පේලියේ 1 තීරුවයි

23. භරත නාට්‍යයම්හි කණට පළඳින ආභරණයක් වන්නේ
i. A පේලියේ 4 තීරුවයි
ii. A පේලියේ 3 තීරුවයි
iii. D පේලියේ 3 තීරුවයි
iv. C පේලියේ 3 තීරුවයි

24. කථකලි නර්තන සම්ප්‍රදායේ වේෂ නිරූපණ ශිල්පියා ලෙස හඳුන්වන්නේ
i. D පේලියේ 4 තීරුවයි
ii. C පේලියේ 2 තීරුවයි
iii. A පේලියේ 4 තීරුවයි
iv. B පේලියේ 3 තීරුවයි

25. භරත නාට්‍යම්වල ගුරුවරයා හඳුන්වනු ලබන්නේ
i. A පේලියේ 3 තීරුවයි
ii. B පේලියේ 4 තීරුවයි
iii. D පේලියේ 4 තීරුවයි
iv. A පේලියේ 1 තීරුවයි

## 26 සිට 40 පිළිතුරු සපයන්න.

26 මාත්‍රා 2 + 3 තිත් රූපයට අයත් බෙර පදය
i. දොං දොං පිං පිං ගජිගත
ii. දොං පිංත ගත දොංත
iii. දොං ජිජි ගත
iv. දොං තකු පිං පිං

27. තාල රූප දෙකකට නර්තනය කරනු ලබන එකම වන්නම වන්නේ
i. තුරඟා
ii. සිංහරාජ
iii. මුසලඩි
iv. වෛරොඩි

28 මාත්‍රා 2 + 2 + 3 තාල රූපය හඳුන්වනු ලබන්නේ
i. දෙසුලු මැදුම් තුන් තිතයි
ii. සුළු සුළු මැදුම් දෙතිත
iii. දෙසුලු මහ පස්තිත
iv. දෙසුලු මැදුම් සිව් තිත

29 හත්පදයට අයත් නර්තනාංගයකි
i. දලු මුර පදය
ii. තැම්මි පදය
iii. සලු පදය
iv. හමාර පදය

30 මණ්ඩමය හා හඬබෑය අයත් වාද්‍ය භාණ්ඩය වන්නේ
i. උඩැක්කිය
ii. රබාන
iii. බුම්මැඩිය
iv. තම්මැට්ටම

31 කොහොඹා කංකාරියේ එන නාට්‍යමය ලක්ෂණයන්ගෙන් යුත් නර්තනාංගය වන්නේ
i. හත් පදය
ii. දුනු මාලප්පුව
iii. ගුරුගේ මාලාව
iv. ආවැන්දුම්

32 ගායනය සහිත සියලුම යක්දෙස්සන් සභාය වන ප්‍රථම නර්තනාංගය වන්නේ
i. අස්නේ
ii. යක් ඇනුම
iii. ආවැන්දුම
iv. හත් පදය

33 බර අක්ගෙන කඟින් - ඇන කොන් අව්වලින් මෙම කවිය
i. තුරඟා වන්නමට අයත්ය
ii. සැවුලා වන්නමට අයත්ය
iii. සිංහරාජ වන්නමට අයත්ය
iv. මුසලඩි වන්නමට අයත්ය

34 වැදි යකුන් හා මලෙයි යකුන් පුද ලබන ශාන්ති කර්මය නම්
i. බලි යාගයකි
ii. වලියක්ක මංගල්‍යයකි
iii. කොහොඹා කංකාරියකි
iv. කඩවර කංකාරියකි

35 ආධුනික නර්තන ශිල්පියෙකු හිසවෙස් තැබීමේදී මුලින්ම හිසෙහි පළඳින ලබන ආභරණය වන්නේ
i. ජටාව
ii. ශිඛාබන්ධනය

36 කුදාන්ත ගත දොම් වට්ටම අයත් තාල රූපය වන්නේ

i. 2 + 2 + 3 ii. 2 + 3

iii. 2 + 2 + 4 iv. 2 + 2 + 2 + 4

37 දෙතිතට අයත් වන්නම් දෙකකි

i. තුරඟා සහ සිංහරාජ ii. තුරඟා සහ සැවුලා

iii. මුසලඩි හා සැවුලා iv. සිංහරාජ සහ හනුමා

38 සුලු මහා දෙතිතට අයත් කසිතරමක් වන්නේ

i. කුද ගජින කුද ගජින ii. රුංකාක ජිංතාක

iii. කුද ගජිගත කුදගජිගත iv. කුද ගත ගත කුකුදන්

39 ගොයම් නර්තනය නිර්මාණය කර වේදිකාවට ගෙන ඒමේ ගෞරවය හිමිවන්නේ

i. ප්‍රේම්කුමාර එපිටවෙල මහතාටය ii. නිමල් වෙල්ගම මහතාටය

iii. එස්. පනීභාරත මහතාටය iv. චිත්‍රසේන ඩයස් මහතාටය

40 තත් තකට තක රොං-......... තක රොං යන්නෙහි හිස්තැනට ගැලපෙන පදය තෝරන්න

i. තත්කඩ කුද කුද ii. තත් තත් කඩ කඩ

iii. තත්කඩ තත්කඩ කුද iv. තරිකිට කිටිතක

2024-03-13
ශ්‍රේ. 11

## II කොටස

- පළමු ප්‍රශ්ණය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්ණය සහ තවත් ප්‍රශ්ණ හතරක් ඇතුළුව ප්‍රශ්ණ පහකට පිළිතුරු සපයන්න.

01. i. කෝලම් නාටකයේ වෙස් මුහුණු නොපළඳින චරිතය ................ නමින් හඳුන්වයි.
ii. අයිලය යනු උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ................... ශාන්තිකර්මයේ ප්‍රධාන සැරසිල්ලයි
iii. බෞද්ධාගමික සිද්ධස්ථානවල සිදු කෙරෙන දවුල්, තම්මැට්ටම්, හොරණෑ, වාදනය ..........නමින් හැඳින්වේ.
iv. නර්තන සම්ප්‍රදායන් තුනට පොදු වූ ..................ශාන්තිකර්මය නවග්‍රහයින් උදෙසා කරනු ලබයි.
v. කොහොඹා කංකාරියේ වාදකයන්ගේ දක්ෂතා පෙන්නුම් කිරීම .................තුළින් සිදු කෙරේ.
vi. සීනි චරිතය .................. මුද්‍රා නාට්‍යයේ එන චරිතයකි.
vii. එඬැක්ක නම් වාද්‍ය භාණ්ඩය ........................... නර්තනයට යොදාගනු ලබයි.
viii. අඹ විදමන ........................නර්තන සම්ප්‍රදායට අයත් නාට්‍යමය අවස්ථාවකි
ix. රසභාව පිළිබඳ කියවෙන ශාස්ත්‍රීය නම් දෙක නම්
    භරතමුනි-............................................
    නන්දිකේශ්වර ..................................
x. පහත නර්තනාංග අයත් සම්ප්‍රදායන් කුමක්ද ?
    කොහොඹා හැල්ල ..........................................
    යක්තුන් පදය ..................................

Learning Resource Center
R
De Mazenod College
Kandana

02. i. මාත්‍රා 4 + 4 අයත් බෙර පදයක් ප්‍රස්ථාර කරන්න.
ii. 2 + 3 අයත් වන්නමක කවියක් ප්‍රස්තාර කරන්න.
iii 2 + 4 අයත් කස්තිරමක් ප්‍රස්ථාර කරන්න.

03. පහත සඳහන් මාතෘකා අතරින් තුනක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න
i. වන්නම් ii. කස්තිරම
iii. පංචතුර්ය වාදනය iv සතර අභිනය iii. සරල අංගරචනය

04. i. පොළොන්නරු යුගයේ නර්තන කලාව පිළිබඳ පුරා විද්‍යාත්මක සාධක දෙකක් දක්වා කෙටියෙන් විස්තර කරන්න.
ii. නර්තනය හා බැඳි තූර්යවාද්‍ය භාණ්ඩ වලින් නාමාවලින් පිළිබඳ සාධක දෙකක් දක්වන්න.
iii. ගම්පොල යුගයේ නර්තන කලාව පිළිබඳ සාධක දෙකක් ඇසුරෙන් විමසන්න.

05. i. කොහොඹා කංකාරියට අයත් පූර්ව චාරිත්‍ර 2 ක් නම් කොට ඒ පිබඳව කෙටියෙන් හඳුන්වන්න
ii. සම්ප්‍රදායන් තුනට අයත් ශාන්තිකර්ම නම් කොට එහි නර්තනාංග දෙක බැගින් වෙ වෙනම ලියා දක්වන්න.
iii. ගායනය සහිත හා ගායනය රහිත නර්තනාංගය බැගින් නම් කොට ඒ පිබඳව හඳුන්වන්න.

06.

A



B



i. දක්ෂිණ භාරතයේ ප්‍රසිද්ධ නර්තන සම්ප්‍රදාය නම්කොට එහි සංගීත සම්ප්‍රදාය පිළිබඳ පැහැදිලි කරන්න.

II. A නර්තන සම්ප්‍රදාය දේව ඇදහිලි හා බැඳි එක් කතා පුවතක් ලියන්න.

III. A හා B රූපයේ ඇති නර්තන සම්ප්‍රදායන්ගේ ඇඳුම් පැළඳුම් ලියා දක්වන්න.

7)

I. සොකරි හා කෝලම් නාටකවලට අයත් කවියක් බැගින් ලියන්න.

II. කෝලම් නාටකයේ රඟ මඩල පිළිබඳ විස්තරයක් කරන්න.

III. ජන නාටක හා ගැමි නැටුම් වල සමාන අසමානතා හතර බැගින් ලියා දක්වන්න.